Uva Wellassa University

# ජාතික සංවර්ධනයට දායකත්වය සැපයීම අභිමානයකි
# ඇබෑර්තු - ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

## 01. විනයාරක්ෂක II ශ්‍රේණිය

**සුදුසුකම්**

1) පිළිගත් විශ්වවිද්‍යාලයක/ උසස් අධ්‍යාපන ආයතනයක උපාධිධරයකු වීම.

**ශාරීරික සුදුසුකම් :**

පිරිමි - උස 5' 5''

පපුව - 32'' (හුස්ම නොඅල්ලා)

ගැහැණු - උස 5' 4''

**සටහන :**

පොලිස් / හමුදා සේවයේ පළපුරුදු හා විශ්වවිද්‍යාලය තුළ හෝ ජාතික තලයේ ක්‍රීඩා ක්‍රියාකාරකම්වල සමාජ සුබසාධන කටයුතුවල ක්‍රියාශීලීව නිරත වූ අයහට ප්‍රමුඛස්ථානය හිමිවේ.

**හෝ**

2) ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවල මේජර් නිලයට නොඅඩු හෝ ශ්‍රී ලංකා පොලිසියේ සමාන නිලයකට නොඅඩු තනතුරක පළපුරුද්ද සහිත අයවලුන්.

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය** : U-MN3(II) රුපියල් 42,885-18X660-54,765/= (මාසිකව)

**වයස** : අවුරුදු 30 - 45 අතර

## 02. කළමනාකරන සහකාර (පොත් තැබීම) III ශ්‍රේණිය

## 03. කළමනාකරණ සහකාර (සරප්) III ශ්‍රේණිය

## 04. කළමනාකරණ සහකාර (ගබඩා පාලක) III ශ්‍රේණිය

**සුදුසුකම්**

1) අ.පො.ස. (සා/ පෙළ) විභාගය,
   - අ) සිංහල භාෂාව/ දෙමළ භාෂාව
   - ආ) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය
   - ඇ) ගණිතය

   යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව, එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්ව සිටිය යුතු අතර,

**සහ**

2) අ.පො.ස. (උ/ පෙළ) විභාගය එක් වරකදී සාමාන්‍ය (පොදු ප්‍රශ්න පත්‍රය හැර) සියලුම විෂයයන්ගෙන් සමත්ව සිටිය යුතුය.

පහත සඳහන් සුදුසුකම්ලත් අය වෙත ප්‍රමුඛස්ථානය හිමිවේ.

- අ) පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක යෙදවුම් සම්බන්ධයෙන් වූ මාස හයකට (06) නොඅඩු කාලයක, පිළිගත හැකි සුදුසුකම්. **සහ**
- ආ) පරිගණක යෙදවුම් පැකේජ භාවිතයේ වසර දෙකක පළපුරුද්ද.

ඉහත සඳහන් කොට ඇති සුදුසුකම්වලට අමතරව, අයදුම්කරුවන් පහතින් සඳහන් කොට ඇති "තනතුරට විශේෂිත සුදුසුකම්" සතු අය විය යුතුය.

**තනතුරට විශේෂිත සුදුසුකම් :**

**I. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (පොත් තැබීම)**

අ. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ පවත්නා ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / තාක්ෂණ විද්‍යාලයේ ජාතික ගිණුම්කරණ ශිල්පී සහතිකය හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් සමාන වෙනත් සුදුසුකම්.

**හෝ**

ආ) අ.පො.ස. (උ/ පෙළ) විභාග සුදුසුකම් වාණිජ ධාරාවෙන් විය යුතුය.

**II. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (සරප්)**

අ) බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ සඳහන් සාමාන්‍ය අධ්‍යයන සුදුසුකම් යටතේ වන අ.පො.ස. (උ/ පෙළ) විභාගයෙන් ලබාගත් අපේක්ෂිත සාමාර්ථ තුන අතුරින් ගණකාධිකරණය එක් විෂයයක් විය යුතුය.

**සටහන** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය විසින් නිශ්චය කරනු ලබන ආරක්ෂණ තැන්පතුවක් තැබිය යුතුය.

**III. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (ගබඩා පාලක)**

ගබඩා පාලනයේ වසර එකක පළපුරුද්ද / හෝ අ.පො.ස . (සා/ පෙළ) විභාගයෙන් වාණිජ්‍ය විෂය සමත්වීම හෝ අ.පො.ස. (උ/ පෙළ) විභාගයෙන් ගණකාධිකරණ විෂය සමත්වීම.

**සටහන** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය විසින් නිශ්චය කරනු ලබන ආරක්ෂණ තැන්පතුවක් තැබිය යුතුය.

**තෝරාගැනීම** : ලිඛිත විභාගයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය** : U-MN1(IIIA) රුපියල් : 30,725 - 17X300-35,825/= (මසකට)

**වයස** : අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

## 05. ගොවිපළ අධීක්ෂක III ශ්‍රේණිය

**සුදුසුකම්**

1) අ.පො.ස. (සා/ පෙළ) විභාගය, දෙවරකට නොවැඩි වාර ගණනකදී, සිංහල/ දෙමළ / ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/ වාණිජ අංක ගණිතය/ ගණිතය ඇතුළත්ව විෂයයන් හයකින් (06) සමත්වීම.

**සහ**

ප්‍රායෝගික ගොවිපළ පාසල් සහතිකය හෝ සමාන සුදුසුකම් සමග, එවන් සහතිකයක් ලබා දීමෙන් පසුව රජයේ ආයතනයක වසර 10 ක පළපුරුද්ද.

**හෝ**

2) කෘෂිකර්ම පාසල් ඩිප්ලෝමාව (පේරාදෙණිය හෝ කුන්ඩසාලේ) හෝ සමාන සුදුසුකම් සමග අදාළ ඩිප්ලෝමාව ලබාගත් පසු වසර පහක (05) පළපුරුද්ද

තෝරා ගැනීම: සම්මුඛ පරීක්ෂණයක් මගිනි

**වැටුප් පරිමාණය** : U-MT1 (IIIA) රුපියල්: 31,625 - 7X300; 10X355-37,275/= (මසකට)

**වයස** : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 06. වැඩ අධීක්ෂක (සිවිල්) II ශ්‍රේණිය

**සුදුසුකම් :**

1) ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව හෝ සමාන සුදුසුකම්. **සහ**

එවන් සුදුසුකම් ලබාගැනීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්ද.

**සටහන** : අදාළ වසර හතරක (04) පළපුරුද්ද සඳහා ප්‍රායෝගික පුහුණු කාලය අදාළ නොවේ. **හෝ**

2) ජාතික තාක්ෂණ සහතිකය හෝ සමාන සුදුසුකම් සහ එවන් සුදුසුකම් ලබාගැනීමෙන් පසුව, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද.

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය** : U-MN2 (II) රුපියල් 37,275-18X495-46,185/= (මසකට)

**වයස** : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 07. මහජන සෞඛ්‍ය පරීක්ෂක III ශ්‍රේණිය

**සුදුසුකම්** : සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත්වීම හා සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද.

තෝරා ගැනීම : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය** : U-MT1 (IIIA) රුපියල් 31,625-7X300-10X355-37, 275/= (මසකට)

**වයස** : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 08. තාක්ෂණ නිලධාරී (ශ්‍රව්‍ය දෘෂ්‍ය)

**සුදුසුකම් :**

1. අ.පො.ස. (උ/ පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනකින් (03) සමත්විය යුතුය. **සහ**

2) අ) තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද පනතක් මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් පිළිගත් ආයතනයක් වෙතින් ලබාගත් ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රොනික්/ මල්ටිමීඩියා හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය ශිල්පීය ක්‍රම ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම. **හෝ**

ආ) තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රොනික / මල්ටිමීඩියා හෝ ඉහත (2) (අ) සුදුසුකම්වලට සමාන බවට පිළිගත් ශ්‍රව්‍ය දෘෂ්‍ය ශිල්පීය ක්‍රම ක්ෂේත්‍රයේ තාක්ෂණ සුදුසුකම් සමග පිළිගත් ආයතනයක ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්යයන්හි වසර එකක පළපුරුද්ද.

**තෝරා ගැනීම** : ලිඛිත සහ / ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය** : U-MT1 (IIIA) රුපියල් 31,625-7X300-10X355-37, 275/= (මසකට)

**වයස** : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 09. විගණන සහකාර (II ශ්‍රේණිය)

**සුදුසුකම් :**

1) අ.පො.ස. (සා/ පෙළ) විභාගය,
   - අ) සිංහල භාෂාව / දෙමළ භාෂාව
   - ආ) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
   - ඇ) ගණිතය

   යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) එක් වරකදී සමත්ව සිටිය යුතුය.

**සහ**

2) අ.පො.ස. (උ/ පෙළ) විභාගය සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රය හැර) එක් වරකදී, සමත්ව සිටිය යුතුය. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 3 කින් සමත්වීම මෙම අවශ්‍යතාවය සඳහා ප්‍රමාණවත් වේ)

සහ

3) තනතුරට විශේෂිත සුදුසුකම්
   - අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ප්‍රාථමික තලය/ ආවසරික I/ පදනම් තලය / CAB1/ විධායක තලය හෝ සමාන සුදුසුකම්, **හෝ**
   - ආ) කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA) පදනම් තලය. **හෝ**
   - ඇ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) **හෝ**
   - ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පී සංගමයේ (AAT) සාමාජිකත්වය. **සහ**

4) රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතුවල අවම වසර දෙකක (02) පළපුරුද්ද.

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මගිනි

**වැටුප් පරිමාණය** : U-MN2 (II) රුපියල් 37,275-18X495-46, 185/= (මසකට)

**වයස** : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 10. ආරක්ෂක පරීක්ෂක (II ශ්‍රේණිය)

**සුදුසුකම් :**

1) අ) අ.පො.ස. (සා/ පෙළ) විභාගය, දෙවරකට නොවැඩි වර ගණකදී විෂයයන් 5 කට සම්මාන සාමාර්ථ සහිතව සමත්වීම. එම සම්මාන සාමාර්ථවලට අංක ගණිතය/ වාණිජ අංක ගණිතය/ ගණිතය විෂයයන් අයත් විය යුතුය. **සහ**

2) පොලිස් සේවයේ හෝ ආරක්ෂක හමුදා සේවයේ හෝ UGC ආයතනයේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ වෙනත් පිළිගත් ආරක්ෂක සංවිධානයක වසර 5 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක්.

3) ක්‍රීඩා ක්ෂේත්‍රයේ ක්‍රියාශීලිව සහභාගිත්ව කටයුතු කොට තිබිය යුතුය.

4) උස : අඩි 5 අඟල් 4 කට නොඅඩු විය යුතුය.

5) පපුව : අඟල් 34 කට (සාමාන්‍ය) නොඅඩු විය යුතුය.

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මගිනි

**වැටුප් පරිමාණය** : U-MN1(IIIA)රුපියල් 30,725-17X300-35X825 (මසකට)

**වයස** : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 11. හෙද නිලධාරී II ශ්‍රේණිය

**සුදුසුකම් :**

1) අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත්ව සිටීම, **සහ**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගත්, හෙද නිලධාරියෙකු ලෙස ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය** : U-MT1 (IIIA) රුපියල් 31,625-7X300-10X355-37,275/= (මසකට)

**වයස** : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

එයට අමතරව රජය මගින් අනුමත කළ විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ දීමනා ද ගෙවනු ලැබේ.

### අනෙකුත් කොන්දේසි

1. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
2) යථා පරිදි නියමිත ආකෘති පත්‍රයේ සම්පූර්ණ කළ අයදුම්පත්, සියලු ජීවදත්ත සහිතව අදාළ සහතිකවල පිටපත් සමග, සහකාර ලේඛකාධිකාරී මානව සම්පත් අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පස්සර පාර, බදුල්ල යන ලිපිනයට 2021.03.01 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත් ආකෘති හා තොරතුරු විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වන http://www.uwu.ac.lk/vacancies/ වෙතින් බාගත කළ හැක.
3) එක් තනතුරකට වඩා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් විසින් ඒ සඳහා වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. කරුණාකර අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කරන්න.
4) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, උසස් අධ්‍යාපන ආයතනවල, රජයේ දෙපාර්තමේන්තුවල රාජ්‍ය සංස්ථාවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානි මාර්ගයෙන් යොමු කළ යුතුවේ. කෙසේ වෙතත්, අයදුම්පතේ පිටපතක් කලින් ඍජුව යොමු කළ හැක. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් යොමු නොකරන්න. අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.
5) රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ කරන අයදුම්කරුවන් හට වයස් සීමාවන් අදාළ නොවේ.
6) අසම්පූර්ණ අයදුම්පත්, සහායක ලේඛන නොමැතිව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් හා අදාළ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ. අයදුම්කරුවන් කොටි ලැයිස්තුගත කොට එවන් අයවලුන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.

**ලේඛකාධිකාරී,**
**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,**
**055-2226370**

**2021.01.31**